කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2019

සැප්තැම්බර් - 2023

**BMGTE 3025 - කුඩා ව්‍යාපාර කළමනාකරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : අටයි (08) කාලය : පැය 03 යි

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**

(01) අ) කුඩා ව්‍යාපාර යනු කුමක්ද? නිර්වචනය කරන්න. එහි ලක්ෂණ පැහැදිලි කරන්න.

*(ලකුණු 10)*

ආ) ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථිකය තුළ කුඩා ව්‍යාපාරවල වැදගත්කම සහ රැකියා උත්පාදනය සහ නවෝත්පාදනය සඳහා කුඩා ව්‍යාපාරවල දායකත්වය සාකච්ඡා කරන්න.

*(ලකුණු 10)*

**(මුළු ලකුණු 20)**

(02) ඔබ හස්ත ස්වර්ණාභරණ නිෂ්පාදන සහ අලෙවි කුඩා ව්‍යාපාරයක අලුතින් පත් කළ කළමනාකරුවෙක් යැයි සිතන්න. කළමනාකරු වශයෙන්, ඔබ ව්‍යාපාරයේ සාර්ථකත්වය සහ වර්ධනය සහතික කිරීම සඳහා කළමනාකරණ කාර්යයන් කාර්යක්ෂමව ඉටු කළ යුතුය.

පහතින් දී ඇති පැතිකඩයන් ඇසුරුකර ගනිමින් පිළිතුරු සපයන්න.

i) සැලසුම් කිරීම:

කුඩා ව්‍යාපාර තුළ සැලසුම් කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

ii) සංවිධානය කිරීම:

කුඩා ව්‍යාපාර කළමනාකරණයේ සංවිධානය වීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.

iii) නායකත්වය:

සේවකයින් දිරිමත් කිරීම සහ ව්‍යාපාරය එහි ඉලක්ක කරා මෙහෙයවීම සඳහා ඵලදායී නායකත්වයක් අත්‍යවශ්‍ය වන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

iv) පාලනය:

පාලනය පිළිබඳ සංකල්පය සහ කුඩා ව්‍යාපාර කළමනාකරණයේ එහි වැදගත්කම පැහැදිලි කරන්න.

**(මුළු ලකුණු = 5 x 4 = 20)**

(03) අ) ව්‍යාපාර සැලැස්මක් යනු කුමක්ද? පහදන්න.

(ලකුණු 05)

ආ) කුඩා ව්‍යාපාරයක වර්ධනයට සහ සාර්ථකත්වයට මඟ පෙන්වීම සඳහා ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීම අත්‍යවශ්‍ය වේ. විස්තීරණ ව්‍යාපාර සැලැස්මක කොටස් ගෙනහැර දක්වමින් එය කළමනාකරණ මෙවලමක් ලෙස භාවිතා කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.

*(ලකුණු 15)*

***(මුළු ලකුණු 20)***

(04) අ) ශ්‍රී ලංකාවේ කුඩා ව්‍යාපාරවලට අදාළ නීති පහක් (05) ලැයිස්තුගත කරන්න.

(ලකුණු 05)

ආ) ඔබ ශ්‍රී ලංකාවේ කුඩා ව්‍යාපාරයක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන ව්‍යවසායකයෙකි. ව්‍යාපාර මෙහෙයුම් වලදී ආරවුල් ඇති විය හැකි බව අවබෝධ කර ගැනීම නිසාවෙන්, එවැනි තත්ත්වයන් සමඟ කටයුතු කිරීමේදී හොඳින් සූදානම් වීමට ඔබ අරමුණු කරයි. ශ්‍රී ලංකාවේ කුඩා ව්‍යාපාරවල ආරවුල් විසඳීමේ විවිධ ක්‍රම සාකච්ඡා කරන්න.

*(ලකුණු 15)*

***(මුළු ලකුණු 20)***

(05) කුඩා ව්‍යාපාර කළමනාකරණය හදාරන උපාධි අපේක්ෂකයෙකු ලෙස, වර්තමාන ගතික ව්‍යාපාරික පරිසරය තුළ කුඩා ව්‍යාපාර මුහුණ දෙන අභියෝග විශ්ලේෂණය කිරීමට ඔබට අවශ්‍ය වේ. පහතින් දී ඇති පැතිකඩයන් ඇසුරුකරමින් පිළිතුරු සපයන්න.

i) මූල්‍ය ප්‍රවේශය

ii) වෙළඳපල තරඟය

iii) තාක්ෂණයට අනුගත වීම

iv) අලෙවිකරණය සහ පාරිභෝගික අත්පත් කර ගැනීම

***(මුළු ලකුණු- 5 x 4 = 20)***

(06) අ) ව්‍යවසායකත්වය යනු කුමක්ද? නිර්වචනය කරන්න.

(ලකුණු 05)

ආ) විවිධ ව්‍යවසායකත්ව වර්ග තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. එක් එක් වර්ගය සඳහා එහි ලක්ෂණ නිදර්ශනය කිරීම සඳහා කෙටි උදාහරණයක් සපයන්න.

*(ලකුණු 15)*

***(මුළු ලකුණු 20)***

(07) කුඩා ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා සමාජ මාධ්‍ය සහ ඩිජිටල් අලෙවිකරණය අත්‍යවශ්‍ය වී ඇත. කුඩා ව්‍යාපාර සඳහා අලෙවිකරණ මෙවලමක් ලෙස සමාජ මාධ්‍ය භාවිතා කිරීමේ වාසි සහ සීමාවන් සාකච්ඡා කරන්න.

*(ලකුණු 20)*

(08) අ) කුඩා ව්‍යාපාර කළමනාකරණය හදාරන උපාධි අපේක්ෂකයෙකු ලෙස, කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාර වල සන්දර්භය තුළ අභ්‍යන්තර හා බාහිර වර්ධන උපාය මාර්ග පිළිබඳ සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න.

*(ලකුණු 10)*

ආ) මෙම උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේදී කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට මුහුණ දීමට සිදු විය හැකි විශේෂිත අභියෝග සහ අවස්ථා සාකච්ඡා කරන්න.

*(ලකුණු 10)*

***(මුළු ලකුණු 20)***